ඇමුණුම 01

# ශ්‍රී ලංකා මහජන පක්ෂ ව්‍යවස්ථාව

**01.** **නම, වර්ණය සහ ලාංඡනය**

1.1 පක්ෂයේ නම - ශ්‍රී ලංකා මහජන පක්ෂය

1.2 පක්ෂයේ ලාංඡනය - පුන් කලස, වී කරල් දෙක මැද ශ්‍රී ලංකා සිතියම මධ්‍යයේ දැල්වෙන පහන වේ.

1.3 පක්ෂයේ වර්ණය - දම් පාට වේ.

1.4 පක්ෂයේ මැතිවරණ ලාංඡනය - ඇස

**02.** **(අ)** **පක්ෂ සංවිධාන ව්‍යුහය**

2.1 ජාතික නියෝජිත සම්මේලනය
2.2 මධ්‍යම කාරක සභාව
2.3 දේශපාලන මණ්ඩලය
2.4 විධායක සභාව
2.5 දිස්ත්‍රික් සංවිධාන කමිටුව
2.6 ආසන මධ්‍ය සංවිධානය
2.7 පක්ෂ ශාඛා වෙනුවට ප්‍රාදේශීය සංවිධාන
2.8 පක්ෂ ශාඛා

**(ආ)** **අනුබද්ධ සංවිධාන**

පහත නම් සඳහන් සංවිධාන සහ පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ අභිමතය පරිදි පිහිටුවනු ලබන වෙනත් සංවිධාන වලින් අනුබද්ධ සංවිධාන සමන්විත වේ.

1. ශ්‍රී ලංකා මහජන කාන්තා සම්මේලනය
2. මහජන තරුණ පෙරමුණ
3. ශ්‍රී ලංකා මහජන වෘත්තීය සමිති සම්මේලනය
4. ශ්‍රී ලංකා මහජන ආගමික සහජීවන සංවිධානය
5. ශ්‍රී ලංකා මහජන රජයේ වෘත්තීය සමිති සම්මේලනය
6. මහජන භික්ෂු සංවිධානය
7. මහජන සංස්කෘතික හා කලා සංවිධානය
8. මහජන ශිෂ්‍ය සංගමය
9. ශ්‍රී ලංකා මහජන ධීවර සංවිධානය
10. ශ්‍රී ලංකා මහජන [illegible]
11. ශ්‍රී ලංකා මහජන ගුරු සංවිධානය
12. ශ්‍රී ලංකා මහජන වතු සේවක සංගමය
13. ශ්‍රී ලංකා මහජන දේශීය වෛද්‍ය සංවිධානය
14. ශ්‍රී ලංකා මහජන ගොවි සම්මේලනය
15. ශ්‍රී ලංකා මහජන උපාධිධාරී සංවිධානය
16. ශ්‍රී ලංකා මහජන රැකියාලාභීන්ගේ එකමුතුව
17. ශ්‍රී ලංකා මහජන දුම්රිය සේවක සමිතිය
18. ශ්‍රී ලංකා මහජන වෛද්‍ය සංගමය
19. මහජන සුව සේවා සංගමය
20. මහජන ප්‍රවාහන සේවක සමිතිය
21. විජය කුමාරතුංග සහෘද සංසදය

**03.** **පක්ෂ සංවිධාන ප්‍රතිපත්ති**

පක්ෂයේ සංවිධාන ප්‍රජාතන්ත්‍රවාදයේ පිහිටා ඇති අතර, සංවිධාන පිළිබඳව මූලික ප්‍රතිපත්ති පහත සඳහන් පරිදි වනු ඇත.

3.1 පහළම සංවිධානයේ සිට ඉහළම සංවිධානය දක්වා වූ සියලුම සංවිධාන වල නිළධාරීන් ඡන්දයෙන් තේරී පත්වනු ඇත.

3.2 ඉහළම සංවිධානවල නායකයන් පහළම සංවිධාන විසින් ඉදිරිපත් කරන අදහස්වලට සැලකිල්ල දැක්විය යුතු අතර ඉහල සංවිධාන වල තීරණ පහළ සංවිධාන වලට පැහැදිලි කර දිය යුතුය.

3.3 පක්ෂ වැඩ වලදී සාමූහික නායකත්වය හා පුද්ගලික වගකීම් සම්බන්ධ කළයුතුය.

3.4 සාමාජිකයින් තම සංවිධානවලට අවනත විය යුතු අතර පහළ සංවිධාන ඉහළ සංවිධානවල තීරණවලට අවනත විය යුතුය.

3.5 පක්ෂයේ සියලුම සංවිධාන පොදු එකඟතාවයෙන් තීරණ ගැනීමට වෑයම් කළ යුතුය. එසේ නොහැකි වූ විට වැඩි ඡන්දයෙන් තීරණ ගත යුතුය.

3.6 පක්ෂයේ පහළ සංවිධාන ඉහල සංවිධානවල තීරණ වලින් බැඳේ.

3.7 සියලුම සාමාජිකයින් පක්ෂයේ විනයට අනුව ක්‍රියා කළ යුතුය. පක්ෂයේ විනය සෑම සාමාජිකයකුටම එක සමානව ක්‍රියාත්මක විය යුතුය.

3.8 පක්ෂ ව්‍යවස්ථාවේ 2(ආ) සඳහන් සියලුම සංවිධාන පක්ෂයේ මග පෙන්වීමට අවනත විය යුතුය. එමෙන්ම පක්ෂය සමග සමගාමීව කටයුතු කළ යුතුය. පක්ෂයේ උන්නතිය වෙනුවෙන් එක්ව කටයුතු කළයුතුය. එසේ කටයුතු නොකරන සංවිධාන සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මධ්‍යම කාරක සභාවට බලය ඇත්තේය.

## 04. සාමාජිකත්වය

වයස අවු. 18 ට නො අඩු පක්ෂයේ

(අ) ප්‍රතිපත්ති වැඩ පිළිවෙළ හා තීරණ
(ආ) ව්‍යවස්ථාව හා විනය පිළිගන්නා
(ඇ) පක්ෂ සාමාජික ගාස්තු ගෙවන
(ඈ) වෙනත් දේශපාලන පක්ෂයක හෝ දේශපාලන සංවිධානයක සාමාජිකත්වය නොදරන අයෙකුට පක්ෂයේ සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ඇත.

## 05. සාමාජිකත්වය ලබාගැනීම

5.1 සාමාජිකයෙකු වශයෙන් පක්ෂයට බැඳීමට කැමති අයෙකු විසින් නියමිත සාමාජික ඉල්ලුම්පත්‍රය පුරවා තමන් පදිංචි ප්‍රදේශයේ ශාඛාවේ සාමාජිකයින් දෙදෙනකුගේ යෝජනා ස්ථිරත්වය ඇතිව එම වර්ෂයේ සාමාජික මුදල් සමග අදාල පක්ෂ ශාඛාවට ඉදිරිපත් කළ යුතුය. අදාල ශාඛාවේ අනුමැතිය සහිතව එම ඉල්ලුම්පත්‍රය ආසන මධ්‍ය සංවිධානය වෙත ඉදිරිපත් කළ යුතුය. එම මධ්‍ය සංවිධානයේ අනුමැතිය සහිතව එම ඉල්ලුම් පත්‍රය පක්ෂ මූලස්ථානයට ඉදිරිපත් කළ යුතු අතර ඉන්පසුව ඔහුට/ඇයට සාමාජිකත්වය පිරිනැමිය හැක.

5.2 පක්ෂ ශාඛාවක් නොමැති ප්‍රදේශයක අයෙකුට පක්ෂ සාමාජිකත්වය ලබාගැනීම සඳහා නියමිත සාමාජික ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර සාමාජිකයින් දෙදෙනෙකුගේ යෝජනා ස්ථිරත්වය ඇතිව අදාල ආසන මධ්‍ය සංවිධානයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉහත 5.1 ඡේදයේ සඳහන් ආකාරයට පක්ෂ මූලස්ථානයට ඉදිරිපත් කිරීමෙන් සාමාජිකත්වය ලබාගත හැක.

5.3 පක්ෂ ශාඛාවක් හෝ ආසන මධ්‍ය සංවිධානයක් නොමැති ප්‍රදේශයක පදිංචි අයෙකුට සාමාජිකත්වය ලබාගැනීම සඳහා තම සාමාජික ඉල්ලුම් පත්‍රය පක්ෂ සාමාජිකයන් දෙදෙනකුගේ යෝජනා ස්ථිරත්වය ඇතිව දේශපාලන මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් සාමාජිකත්වය ලාබගත හැක.

5.4 සාධාරණ හේතුවක් මත පක්ෂයට සාමාජිකයෙක් ලෙස බැඳීමට අයදුම් කරන අයෙකුට දේශපාලන මණ්ඩලයේ එකඟතාවය අනුව සාමාජිකත්වය ප්‍රධානය කළ හැක.

## 06. සාමාජිකත්වය අලුත් කිරීම හා මාරු කිරීම

6.1 සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පෙර ඊළඟ වර්ෂය සඳහා රුපියල් 100 ක සාමාජික මුදලක් සාමාජික මුදල් ලෙස ගෙවිය යුතුය. එම මුදල වෙනස් කිරීම සඳහා මධ්‍යම කාරක සභාවට බලය ඇත්තේය.

6.2 සාධාරණ හේතුවක් නොමැතිව නොකඩවා වර්ෂ දෙකක් සාමාජික මුදල් නොගෙවා සාමාජිකත්වය අලුත් කර නොගත් සාමාජිකයාට එම වර්ෂ දෙකේ ඡන්ද බලය අහිමි සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි වේ. ඉන්පසු ඔහු/ ඇය යළිත් පක්ෂයට බැඳිය යුත්තේ නව සාමාජිකයෙකු ලෙසිනි. විශේෂ වූ හේතුවක් නිසා හිඟ සාමාජික මුදල් ගෙවා සාමාජිත්වය අඛණ්ඩ කරගත හැක. එකී හේතුව අදාල ශාඛාව විසින් නිර්දේශ කළ යුතුය.

6.3 එක් ශාඛාවකින් තවත් ශාඛාවකට සාමාජිකයෙකු මාරු කළ හැක්කේ ඔහුගේ/ඇයගේ ඉල්ලීම පිටය.

6.4 රටින් බැහැරව යන යම් නිලතලයක් දරණ සාමාජිකයෙකු තමා එසේ යාමට පෙර ඒ සඳහා තමන් කටයුතු කරන සංවිධානයට දැන්විය යුතුය. පක්ෂ සංවිධානය විසින් ඒ බව පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා මගින් දේශපාලන මණ්ඩලයට දැනුම්දිය යුතු අතර, එසේ රටින්බැහැරව යාමට පෙර දේශපාලන මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය.

6.5 රටින් බැහැරව යාමට පෙර තම ගමන් විස්තරය හා රටින් බැහැරව සිටින කාල පරිච්ඡේදය දැනුම් දෙමින් තම ගමන ගැන සියලු විස්තර පක්ෂයේ දේශපාලන මණ්ඩලයට දැන්වීම රටින් බැහැරව යන සියලු නිලතල දරණ සාමාජිකයන්ගේ යුතුකම වේ. එසේම රටින් බැහැරව සිටින කාලය මාස 06 ඉක්මවන්නේ නම් ඔහු/ඇය සිය තනතුරෙන් ඉවත්විය යුතු අතර, එම කාලය තුළ ඔහු/ඇය දේශපාලන කටයුතුවල ක්‍රියාකාරී ලෙස කටයුතු නොකරන්නේ නම් එසේ ඉවත්කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතු වේ. කෙසේ වෙතත් මෙම කාලය ඉක්මවන්නේ නම් ඔහු/ඇය විසින් කරන සාධාරණ ඉල්ලීමක් සලකා බැලිය යුතුය.

6.6 සාමාජික මුදල් පහත පරිදි ගෙවිය යුතුය.

(අ) සාමාජිකයෙකුගෙන් වාර්ෂිකව - රු 100/-
(ආ) විධායක සභිකයෙක් මාසිකව - රු 200/-
(ඇ) මධ්‍යම කාරක සභිකයෙක් මාසිකව - රු 200/-
(ඈ) දේශපාලන මණ්ඩල සභිකයෙක් මාසිකව - රු 1000/-
(ඉ) පළාත් පාලන සභිකයෙක් මාසිකව - රු 500/-
(ඊ) පළාත් පාලන ආයතන ප්‍රධානීන් මාසිකව - රු 1000/-
(උ) පළාත් සභා සභිකයෙක් මාසිකව - රු 5,000/-
(ඌ) පාර්ලිමේන්තු මන්ත්‍රී මාසිකව - රු 10,000/-

පක්ෂයේ සියලුම පාර්ලිමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන ප්‍රධානීන් සහ සභිකවරු මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන අනුග්‍රාහක මුදලක් මාසිකව ලබාදිය යුතුය. මෙම මුදල් ගෙවීම නිසියාකාරව සිදුකරවීම පක්ෂයේ භාණ්ඩාගාරිකවරයා සතු වගකීමකි.

## 07. සාමාජිකයන්ගේ වගකීම් හා යුතුකම්

7.1 පක්ෂයේ ප්‍රතිපත්ති හා තීරණ වලට අනුව ක්‍රියා කළ යුතුය.

7.2 පක්ෂයේ ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුව ක්‍රියා කළ යුතුය.

7.3 පක්ෂයේ ප්‍රතිපත්ති හා තීරණ සකස් කිරීමට ආධාර විය යුතුය එම
එම ප්‍රතිපත්ති හා තීරණ ජනතාව අතරට ගෙන යාම සහ ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

7.4 පක්ෂය ඉදිරියේ අවංක හා සත්‍යගරුක හා විනයගරුකවිය යුතුය. තමාගේ පුද්ගලික හා සමාජ කටයුතුවලදී පක්ෂයේ අභිලාෂයන්ට ඉහළින් තබාගත යුතුය.

7.5 සාමාජික මුදල් නොකඩවා ගෙවිය යුතුය.

7.6 කල්ලිවාදී හා විනය විරෝධී කටයුතුවල යෙදීමෙන් වැළකිය යුතුය. එබඳු කටයුතු කිසිවකට ඒවා මොන ස්වරූපයෙන් ප්‍රකාශ වුවද සහයෝගය නොදිය යුතුය.

7.7 පක්ෂයේ දේශපාලනමය හා සංවිධානාත්මක සමගිය ආරක්ෂා කළ යුතුය.

7.8 සියලුම මැතිවරණවලදී පක්ෂයේ අපේක්ෂකයන්ගේ ජයග්‍රහණය සඳහා පූර්ණ ලෙස වැඩ කළ යුතුය.

## 08. සාමාජිකයන්ගේ අයිතිවාසිකම් හා බලතල

8.1 පක්ෂ ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව පක්ෂ සංවිධානවලට නිලධාරීන් තෝරා පත්කර ගැනීමට හා තනතුරුවලට පේරී පත්වීමට ඇති අයිතිය.

8.2 පක්ෂයේ ප්‍රතිපත්ති, වැඩ පිළිවෙල, උපක්‍රම හා පක්ෂයේ සංවිධානාත්මක කටයුතු ගැන අදහස් ප්‍රකාශ කිරීම, සාකච්ඡා කිරීම හා ඒවා සකස් කිරීමට සහභාගී වීම, ඒ පිළිබඳ අදහස් යෝජනා අදාල පක්ෂ සංවිධානය මගින් පක්ෂයේ මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට ඇති අයිතිය.

8.3 පක්ෂයේ ඕනෑම සංවිධානයක්, නිලධාරියකු හෝ සාමාජිකයකු කරන වරදක් පෙන්වා දීමේදී අදාල පක්ෂ සංවිධානයන්ට සීමා විය යුතු අතර එබඳු කරුණු කුමන තත්ත්වයක් යටතේ වුවද අදාල සංවිධානයෙන් පිටතට නොගෙන යා යුතුය.

## 09. පක්ෂ සංවිධාන බල අධිකාරිය

9.1 පක්ෂයේ ඉහළම සංවිධානය හා අධිකාරිය ජාතික නියෝජිත සම්මේලනයයි.

9.2 ජාතික නියෝජිත සම්මේලන දෙකක් අතර පක්ෂයේ ඉහළම බලධාරී මණ්ඩලය වන්නේ ජාතික නියෝජිත සම්මේලනයෙන් තෝරා පත්කර ගන්නා ලද මධ්‍යම කාරක සභාවයි.

9.3 මධ්‍යම කාරක සභාව විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, මගපෙන්වීම හා සමාලෝචනය කිරීමේ වගකීම පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා සතු වන්නේය.

## 10. පක්ෂ ශාඛා

10.1 පක්ෂයේ මූලික ඒකකය පක්ෂ ශාඛාවයි.

10.2 පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව පූර්ණ කාලීනව පක්ෂයේ වැඩ කරන මධ්‍යම කාරක සභිකයින් හැර අන් සියළුම පක්ෂ සාමාජිකයන් පක්ෂයේ ශාඛාවට අයත් විය යුතුය.

10.3 පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව ගම, ඡන්ද මධ්‍යස්ථානය හෝ පළාත් පාලන කොට්ඨාශ හා බල ප්‍රදේශ පදනම් කරගෙන පක්ෂ ශාඛා පිහිටුවිය යුතුය.

10.4 ශාඛා සමිතියක් පිහිටුවීම අවම වශයෙන් සාමාජික 10 දෙනෙකු සිටිය යුතුය.

10.5 පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව වැඩ පළ, උසස් අධ්‍යාපන ආයතන හෝ විදේශ රටක හෝ විදේශ රැකියාවල නියුක්තව සිටින අයට හෝ පක්ෂ ශාඛා පිහිටුවිය හැක.

10.6 එලෙස ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ශාඛාවල ලියාපදිංචිය සඳහා එය පිහිටුවා දින 14 ක් ඇතුළත අදාල ආසනයේ හෝ දිස්ත්‍රික්කයේ සංවිධායකවරයාගේ නිර්දේශය සහිතව පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට ලබාදිය යුතුය.

10.7 ලියාපදිංචිය නොලද ශාඛා පක්ෂ ශාඛා ලෙස පිළිනොගැනේ.

## 11. ආසන මධ්‍ය සංවිධානය

11.1 අදාල මැතිවරණ කොට්ඨාශය ආසන මධ්‍ය සංවිධානයේ බල ප්‍රදේශය වන්නේය.

11.2 ආසන මධ්‍ය සංවිධානය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේ.

(අ) ආසනය තුළ පිහිටි සියලුම ශාඛා සමිතිවල සභාපතිවරු, ලේකම්වරු හා භාණ්ඩාගාරිකවරු

(ආ) ආසනය තුළ ඇති පළාත් පාලන ආයතනවලට තේරීපත්වුන පක්ෂ සාමාජික සභිකයින්

(ඇ) ආසනය තුළ ඇති පළාත් පාලන හා පළාත් සභාවලට ඉදිරිපත්වුන පක්ෂ අපේක්ෂකයින්

(ඈ) ආසනයේ පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ පළාත් සභා මන්ත්‍රීවරු

(ඉ) ආසන මධ්‍ය සංවිධානය විසින් යෝජනා ස්ථිරත්වයෙන් එයට අනුබද්ධ කරගත හැකි තුන්දෙනෙකුට නොවැඩි පක්ෂ සාමාජිකයන්

(ඊ) බල ප්‍රදේශයේ තරුණ හා කාන්තා සංවිධානවලින් තෝරා එවනු ලබන නියෝජිතයන් තුන්දෙනා බැගින් වූ සාමාජිකයින් ද.

(උ) බල ප්‍රදේශයේ තිබෙන පක්ෂයේ අනුබද්ධ සංවිධානවල නියෝජිතයින් දෙදෙනෙක්

(ඌ) ආසන බල ප්‍රදේශය තුළ නිත්‍ය පදිංචි විධායක සභික හා මධ්‍යම කාරක සභිකයින් ද වේ.

11.3 ඉහත 11.2 උප වගන්තියෙන් දක්වා ඇති සාමාජිකයන් අතුරෙන් පහත දැක්වෙන පරිදි නිලධාරී මණ්ඩලයක් යටත් පිරිසෙයින් කාරක සභිකයන් 10 දෙනෙක් ද සහිතව වසර දෙකකට වරක් තොරා පත්කර ගත යුතුය. සභාපති, උප සභාපතිවරු පස් දෙනෙක්, ලේකම්, සහකාර ලේකම්වරු පස්දෙනෙක් හා භාණ්ඩාගාරිකවරයෙක්, එමෙන්ම පැවිදි හා ගිහි අනුශාසක මණ්ඩලයක් ද තෝරාපත්කරගත යුතුය.

11.4 ආසන මධ්‍ය සංවිධානයේ සභාපතිවරයා ආසනයේ ප්‍රධාන සංවිධායකවරයා වන්නේය. ඔහුට/ඇයට සහාය ලබාදිය හැකි ආසන කළමණාකරුවෙක් ද පත්කරගත හැක. ආසන මධ්‍ය සංවිධානයක් ක්‍රියාත්මක නොවන ආසනයක් සඳහා තාවකාලික සංවිධායකයෙකු දේශපාලන මණ්ඩලය විසින් පත්කරනු ඇත. එසේ පත්කරනු ලබන සංවිධායකවරයා පක්ෂ ව්‍යවස්ථාවේ අංක 11.1 සිට 11.3 දක්වා වන ප්‍රතිපාදන යටතේ ආසන මධ්‍ය සංවිධානය පිහිටුවිය යුතුය. දේශපාලන මණ්ඩලය ගන්නා තීරණ මධ්‍යම කාරක සභාවේ අනුමැතිය සඳහා ඊළඟ සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.

## 12. ආසන මධ්‍ය සංවිධානයේ බලතල හා යුතුකම්

12.1 සංවිධාන බල ප්‍රදේශය තුළ සියලුම පක්ෂ කටයුතු මෙහෙවීම.

12.2 බල ප්‍රදේශය තුළ සුදුසු මධ්‍යස්ථානයක කාර්යාලයක් පිහිටුවා ගැනීම.

12.3 බල ප්‍රදේශය තුළ පක්ෂයේ මැතිවරණ අපේක්ෂකයන්ගේ ජයග්‍රහණ සඳහා කටයුතු කිරීම.

12.4 පක්ෂයේ මුදල් කාරක සභාවේ අනුමැතිය ඇතිව යෝජනාවක් සම්මත කර ගැනීමෙන් බල ප්‍රදේශය තුළ පක්ෂ අරමුදලක් පිහිටුවා ගැනීම.

12.5 තම බල ප්‍රදේශය තුළ පිහිටි පක්ෂ ශාඛා සහ අනුබද්ධ සංවිධානවලට දේශපාලන මග පෙන්වීම.

12.6 මධ්‍ය සංවිධානයේ අය වැය වාර්තාව වර්ෂයකට වතාවක් මහා සභාවට ඉදිරිපත් කොට අනුමත කරවා ගත යුතු අතර, එකී වාර්තාවේ පිටපතක් පක්ෂයේ භාණ්ඩාගාරිකට ඉදිරිපත් කළ යුතුය.

12.7 ආසන මධ්‍ය සංවිධානය සෑම මාස දෙකකට වරක් රැස්විය යුතුයි. රැස්වීම පිළිබඳ වාර්තා පක්ෂ මූලස්ථානයට සංවිධානය රැස්වී සතියක් තුළදී එවිය යුතුය නිලධාරී මණ්ඩලය මසකට වරක් රැස්විය යුතුය.

## 13. දිස්ත්‍රික් සංවිධාන කමිටුව -

13.1 මැතිවරණ දිස්ත්‍රික් බල ප්‍රදේශය දිස්ත්‍රික් සංවිධාන කමිටු බල ප්‍රදේශය වේ.

13.2 දිස්ත්‍රික් බල ප්‍රදේශයේ පිහිටි ආසන මධ්‍ය සංවිධානවලින් එකී ආසන මධ්‍ය සංවිධානයේ නිලධාරීන් 13 දෙනා ද, දිස්ත්‍රික් බල ප්‍රදේශයේ පදිංචි මධ්‍යම කාරක සභික, විධායක සභිකවරු ද, දිස්ත්‍රික් බල ප්‍රදේශයේ පිහිටුවා ඇති සහ 2(අ) යටතේ සඳහන් අනුබද්ධ සංවිධාන නියෝජනය සඳහා එක් සංවිධානයකින් එක් නියෝජිතයකු බැගින් ද, මධ්‍ය සංවිධාන පිහිටුවා නොමැති ආසන බල ප්‍රදේශ වලින් එකී ආසනයක් නියෝජනය කිරීම සඳහා එක් ආසනයකින් නියෝජිතයින් දෙදෙනෙකුගෙන් බැගින් ද දිස්ත්‍රික් සංවිධාන කමිටුව සමන්විත වේ.

13.3 දිස්ත්‍රික් සංවිධාන කමිටුවේ පළමුවන රැස්වීමේදී කමිටු සාමාජිකයින් අතුරින් සභාපතිවරයෙක්, ලේකම්වරයකු, භාණ්ඩාගාරිකවරයෙක්, උප සභාපතිවරුන් 05 දෙනෙකු, උප ලේකම්වරු 05 දෙනෙකු, හා කාරක සභාව 10 දෙනෙකු, සංවිධායකවරයෙකු,

කළමණාකරුවෙක් ද ගිහි හා පැවිදි අනුශාසක මණ්ඩලයක් තෝරා පත් කළ යුතුය.

13.4 දිස්ත්‍රික් සංවිධානයේ ප්‍රතිපත්ති සභාපතිවරයා දිස්ත්‍රික් ප්‍රධාන සංවිධායකවරයා වන්නේය. ඔහුට/ඇයට සහාය ලබාදිය හැකි දිස්ත්‍රික් කළමණාකරුවෙක් ද පත්කරගත හැක.

13.5 ජාතික නියෝජිත සම්මේලනයට මාස 03 කට පෙර දිස්ත්‍රික් සංවිධාන කමිටු කැඳවා ප්‍රතිසංස්කරණය කොට නව නිලධාරී මණ්ඩලයක් තෝරා පත්කරගත යුතුය. මේ සඳහා පක්ෂ ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය ලබාගැනීම අනිවාර්ය වේ.

14. **දිස්ත්‍රික් සංවිධාන කමිටුවේ වගකීම -**

14.1 පක්ෂ ව්‍යවස්ථාවට ද, ජාතික නියෝජිත සම්මේලනයෙන් තෝරා පත්කර ගනු ලබන මධ්‍යම කාරක සභාවේ තීරණවලට ද අනුකූලව තම බල ප්‍රදේශයේ ආසන මධ්‍ය සංවිධාන හා අනුබද්ධ සංවිධානවලට දේශපාලන හා සංවිධානාත්මක නායකත්වය ලබාදීම.

14.2 මධ්‍යම කාරක සභාවේ තීරණවලට යටත්ව පක්ෂ සාමාජිකයින්ගේ විනය පාලනය පැවැත්වීම.

14.3 තම බල ප්‍රදේශය තුළ පක්ෂයේ ප්‍රතිපත්ති, තීරණ, ක්‍රියාමාර්ග ජනතාව තුළට ගෙන යාම සඳහා සම්මන්ත්‍රණ, සාකච්ඡා සහ වෙනත් උචිත ප්‍රචාරක කටයුතු මෙහෙයවීම.

14.4 තම බල ප්‍රදේශය තුළ පවත්වන මැතිවරණවලට අපේක්ෂකයන් නිර්දේශ කිරීම.

14.5 මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව තම බල ප්‍රදේශයේ බහුජන සංවිධාන පිහිටුවීම හා එමගින් ප්‍රදේශයේ ජනයාගේ ප්‍රශ්න ගැන සංවිධානාත්මක උද්ඝෝෂණ මෙහෙයවීම.

14.6 දිස්ත්‍රික් සංවිධාන කමිටුව මසකට වරක් හෝ රැස්විය යුතුය.

14.7 මසකට වරක් රැස්වන දිස්ත්‍රික් කමිටු වාර්තා එකී රැස්වීම පවත්වා සතියක් ඉක්මවීමට පෙර පක්ෂ ප්‍රධාන ලේකම්වරයාට එවිය යුතුය.

15. **මධ්‍යම කාරක සභාව හා එහි සංයුතිය -**

මධ්‍යම කාරක සභාවේ සංයුතිය 73 කි.

15.1 හැකිතාක් දුරට පරිපාලන දිස්ත්‍රික්ක නියෝජනය වනසේ මධ්‍යම කාරක සභිකයින් 63 දෙනෙකු ජාතික නියෝජිත සම්මේලනයෙන් තෝරා පත්කර ගත යුතුය. තවත් 10 දෙනෙකු දේශපාලන මණ්ඩලයේ නිර්දේශය පරිදි, මධ්‍යම කාරක සභාවට පත්කරගත යුතුය.

15.2 ජාතික නියෝජිත සම්මේලන දෙකක් අතරතුරදී පක්ෂයේ ඉහළම බල අධිකාරී මණ්ඩලය මධ්‍යම කාරක සභාව වේ. තම නිල කාලය තුළදී සමස්ත පක්ෂය වෙනුවෙන් තීරණ ගැනීමේ අයිතිය මධ්‍යම කාරක සභාවට හිමිවේ.

15.3 ජාතික නියෝජිත සම්මේලනයේදී තෝරා පත්කරගත් මධ්‍යම කාරක සභිකයින් 63 දෙනා විසින් සිය ප්‍රථම රැස්වීමේදී පහත සඳහන් නිලධාරීන් ඔවුන් අතුරින් පත්කර ගත යුතුය.

(අ)
1. ප්‍රධාන අනුශාසක
2. සභාපති
3. ප්‍රධාන ලේකම්
4. භාණ්ඩාගාරික
5. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සභාපති 02
6. නියෝජ්‍ය සභාපතිවරු 02
7. ජ්‍යෙෂ්ඨ උප සභාපති 01
8. උප සභාපති 04
9. නියෝජ්‍ය ලේකම්වරු 02
10. සහකාර ලේකම්වරු 04
11. උප භාණ්ඩාගාරික 01

(ආ) නිළධාරී මණ්ඩලය තෝරාපත්කරගැනීමේදී සියලු ජාතීන් මෙන්ම කාන්තා නියෝජනය ද ලැබෙන පරිදි පත්කර ගැනීම සඳහා හැකිතාක් දුරට කටයුතු කළ යුතුය.

(ඇ) නියෝජ්‍ය සභාපතිවරුන් පත්කිරීමේදී සභාපතිවරයා ලෙස තේරෙන ජාතිය හැර අනෙකුත් ජාතීන් නියෝජනය වන පරිදි පත්කිරීම සඳහා හැකිතාක් දුරට කටයුතු කළ යුතුය.

15.4 ජාතික නියෝජිත සම්මේලනය අවසන්වීමෙන් පසු නොපමාව මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් සංවිධාන පත්කර එම සංවිධාන සතු බලතල පැවරීම කළ යුතුය.

15.5 ජාතික නියෝජිත සම්මේලනය විසින් තෝරා පත්කරගනු ලබන මධ්‍යම කාරක සභාව විසින් සිය ප්‍රථම රැස්වීමේදී 15.3 යටතේ තෝරාගනු ලබන නිලධාරීන්ගෙන් පක්ෂයේ දේශපාලන මණ්ඩලය සමන්විත වන්නේය. අවශ්‍යතාවයන් මත මධ්‍යම කාරක සභාවට මෙම නිළධාරී මණ්ඩලයේ සංශෝධනයන් සිදුකළ හැකිය.

15.6 මධ්‍යම කාරක සභාව යටත් පිරිසෙයින් දෙමසකට වරක් රැස්විය යුතුය.

15.7 මධ්‍යම කාරක සභා රැස්වීමේ මුලසුන පක්ෂයේ සභාපති විසින් දරනු ඇත. සභාපති නොමැති අවස්ථාවක නියෝජ්‍ය සභාපති ද එසේ නොමැති අවස්ථාවක ජ්‍යෙෂ්ඨ උප සභාපති හෝ උප සභාපතිවරයෙක් ද මුලසුන දරනු ඇත.

15.8 මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින් අතුරින් පහත සඳහන් කමිටු පත්කර ගනු ඇත. අවශ්‍යතාවය අනුව එම කමිටු වලට මධ්‍යම කාරක සභාවට පිටතින් වූ පක්ෂ සාමාජිකයින් අතරින් සුදුසු අය සම්බන්ධ කළ හැක. එසේ කිරීමට පෙර ඒ සාමාජිකයන්ගේ නම් දේශපාලන මණ්ඩලය විසින් මධ්‍යම කාරක සභාවට නිර්දේශ කරනු ලැබේ.

1. මුදල් කමිටුව
2. ප්‍රචාරක කමිටුව
3. අධ්‍යාපන කමිටුව
4. වෘත්තීය සමිති කමිටුව
5. අනුබද්ධ සංවිධාන කමිටුව

මධ්‍යම කාරක සභාවේ අභිමතය පරිදි වෙනත් කාර්යයන් සඳහා අවශ්‍ය වූ විටක කමිටු පත්කළ හැක.

15.9 මධ්‍යම කාරක සභාව විසින් අනුශාසක මණ්ඩලයක් සියලුම ආගම් නියෝජනය වන පරිදි පිහිටුවිය යුතුය. ඒ සඳහා පක්ෂයට අවවාද හා අනුශාසනා කළ හැකි ආගමික නායකයින් තෝර පත්කර ගත යුතුය.

15.10 මධ්‍යම කාරක සභාව විසින් පක්ෂයේ ජ්‍යෙෂ්ඨතමයින්, විශේෂඥ දැනුම ඇති විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන බුද්ධිමතුන්ගෙන් සැදුම්ලත් උපදේශක මණ්ඩලයක් පත්කරගත යුතුය. මෙම උපදේශක මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුතුය. මෙම උපදේශක මණ්ඩලය සමග පක්ෂයේ දේශපාලන මණ්ඩලය තෙමසකට වරක් රැස්වී පක්ෂයේ පක්ෂයේ කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතුය. තීරණාත්මක අවස්ථාවන්වල දී පක්ෂයට මගපෙන්වීම හා උපදෙස් ලබාදීම මෙම උපදේශක මණ්ඩලයෙන් බලාපොරොත්තු වේ.

15.11 මධ්‍යම කාරක සභාවේ න්‍යාය පත්‍රය දේශපාලන මණ්ඩලය විසින් සකස් කළ යුතුය. එහෙත් මධ්‍යම කාරක සභිකයෙකුට න්‍යාය පත්‍රයේ අඩංගු කරුණු හැර වෙනත් යම් කරුණක් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යෝජනා කළ හැකි අතර, එය අදාල මධ්‍යම කාරක සභාව විසින් අනුමත කිරීමෙන් පසු න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතුය.

15.12 මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින්ගෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජිකයින්ගේ අත්සනින් ලිඛිත ඉල්ලීමක් කළවිට දෙසතියක් තුළදී මධ්‍යම කාරක සභාවේ විශේෂ රැස්වීමක් කැඳවීමට පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා බැඳී සිටී. එසේ විශේෂ රැස්වීමක් කැඳවීමට හේතු එහි ලිඛිත ඉල්ලීමේ සඳහන් කළ යුතුය.

15.13 මධ්‍යම කාරක සභාව විසින් ගනු ලබන තීරණ මධ්‍යම කාරක සභාවේ පුරප්පාඩු තිබීමේ හේතුව මත අවලංගු නොවේ.

## 16. මධ්‍යම කාරක සභාවේ බලතල

16.1 වෙනත් වගන්තිවල සඳහන් බලතලවලට අමතරව පහත දැක්වෙන බලතල ද මධ්‍යම කාරක සභාවට ඇත.

16.2 පක්ෂයේ ව්‍යවස්ථාව පිළිබඳව, අර්ථ නිරූපනය කිරීමේ අයිතිය මධ්‍යම කාරක සභාව සතුවේ.

16.3 පක්ෂයේ සමස්ත සාමාජිකත්වය හා සංවිධාන කෙරෙහි විනය පාලනය පැවැත්වීම හා ඒ සම්බන්ධයෙන් පියවර ගැනීමේ ඇති අයිතිය.

16.4 මෙම ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ පක්ෂ සංවිධානයක හෝ පක්ෂ සංවිධානයක හෝ සාමාජිකයෙකුගේ හෝ ක්‍රියාකලාපය පක්ෂයේ ප්‍රතිපත්ති, තීරණය හා ක්‍රියාමාර්ගවලට පටහැනි යයිද, නැතහොත් පක්ෂයට හානිකර යයිද, මධ්‍යම කාරක සභාවට ඒත්තු ගියහොත් එම සංවිධාන අත්හිටුවීමට ප්‍රතිසංවිධානය කිරීමට හෝ විසුරුවා හැරීමට සහ පක්ෂයේ සාමාජිකයින්ගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටුවීමට බලය ඇත.

16.5 තම බලතල පක්ෂයේ අන් සාමාජිකයන්ට හා නිලධාරීන්ට පැවරීමට මධ්‍යම කාරක සභාවට හැක.

16.6 ජනාධිපති, පාර්ලිමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන සඳහා දේශපාලන මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන අපේක්ෂකයන් අනුමත කිරීම.

16.7 අවශ්‍ය වූ විටක පක්ෂයේ ඕනෑම සංවිධානයක් හෝ පක්ෂයට අනුබද්ධ සංවිධානයක රැස්වීම් හා සාකච්ඡා කැඳවීම.

16.8 වෙනත් දේශපාලන පක්ෂ හා සංවිධාන සමග සබඳතාවලදී පක්ෂය නියෝජනය කිරීම සහ සමගි සන්ධාන ඇති කර ගැනීම.

16.9 ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම හා වර්ධනය කිරීම.

16.10 මධ්‍යම කාරක සභාවේ තීරණයක් ඇතිව මධ්‍යම කාරක සභාවන්හි අවශ්‍යතා පරිදි මධ්‍යම කාරක සභාවට බාහිර පක්ෂ සාමාජිකයකු හෝ සාමාජිකයන් හෝ මධ්‍යම කාරක සභා රැස්වීම්වලට කැඳවීම හෝ යම් පක්ෂ සාමාජිකයෙකු ලවා නිශ්චිත කරුණක් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරවීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත.

16.11 පක්ෂයේ විනය කමිටුව මධ්‍යම කාරක සභාව විසින් පත්කල යුතුය

16.12 රටතුළ පවතින දේශපාලන තත්ත්වයන් යටතේ පක්ෂ ව්‍යවස්ථාවේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වයට බාධා පැමිණෙන අවස්ථාවක පක්ෂ ව්‍යවස්ථාවේ යම් නියමයන් අත්හිටුවීමේ හා අවශ්‍ය විය හැකි පරිදි තාවකාලික නියමයන් පැනවීමේ අයිතිය මධ්‍යම කාරක සභාවට ඇත.

16.13 පක්ෂයේ ජාතික සම්මේලනය හා අවශ්‍ය වූ විට විශේෂ ජාතික සම්මේලන හා සාකච්ඡා සම්මේලන කැඳවීම.

16.14 ජාතික සම්මේලනය පැවැත්වෙන දින හා ස්ථානය මධ්‍යම කාරක සභාව තීරණය කරනු ඇත.

16.15 ජාතික නියෝජිත සම්මේලන වාර දෙකක් අතරතුර මධ්‍යම කාරක සභාවේ හා දේශපාලන මණ්ඩලයේ ඇතිවන පුරප්පාඩු පිරවීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත.

16.16 රටේ පවතින දේශපාලන තත්ත්වය හෝ වෙනත් බාහිර බාධක තත්ත්වයන් යටතේ පක්ෂයේ ජාතික සම්මේලනය පැවැත්වීම කල්දැමීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත.

16.17 ජාතික නියෝජිත සම්මේලනයට සහභාගී වන නියෝජිත සංඛ්‍යාවේ වෙනස් කිරීම් කිරීමට දේශපාලන මණ්ඩලයේ නිර්දේශය අනුව මධ්‍යම කාරක සභාවට බලය ඇත.

16.18 මධ්‍යම කාරක සභාවේ විශේෂ රැස්වීම් කැඳවීමට පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට බලය ඇත. පක්ෂයේ ක්‍රියාකාරී කමිටුවේ තීරණය පරිදි ප්‍රධාන ලේකම්වරයා විසින් මධ්‍යම කාරක සභාවේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතුය.

**17. දේශපාලන මණ්ඩලය හා එය සතු බලතල සහ වගකීම්.**

පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තෝරාපත්කර ගනු ලබන නිළධාරි මණ්ඩලය පක්ෂයේ දේශපාලන මණ්ඩලය වන්නේය.

17.1 මධ්‍යම කාරක සභා රැස්වීම් දෙකක් අතරතුර කාලයේදී මධ්‍යම කාරක සභාව වෙනුවෙන් ක්‍රියාකිරීමටත්, මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව තීරණ ගැනීමටත්, දේශපාලන මණ්ඩලයට බලය ඇත.

17.2 මධ්‍යම කාරක සභාව විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.

17.3 මධ්‍යම කාරක සභාව වෙනුවෙන් එහි අනුමැතියට යටත්ව පක්ෂයේ පක්ෂයේ සියලුම කටයුතු මෙහෙයවීම.

17.4 තම කටයුතු ගැන මධ්‍යම කාරක සභාවට වාර්තා කළ යුතුය.

17.5 මධ්‍යම කාරක සභාවේ සලකා බැලීම සඳහා යෝජනා හා වාර්තා ඉදිරිපත් කිරීම.

17.6 පක්ෂ සංවිධාන හා සාමාජික විනය පවත්වාගෙන යාම පිළිබඳව මධ්‍යම කාරක සභාව සතු බලතල යටතේ මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව ක්‍රියාකිරීමට දේශපාලන මණ්ඩලයට බලය ඇත.

17.7 ජනාධිපති තනතුර පාර්ලිමේන්තු මැතිවරණ ඇතුළු නියෝජිත මණ්ඩල සඳහා අපේක්ෂකයන් නම් කිරීම සඳහා නාම යෝජනා මණ්ඩල පත්කිරීමට දේශපාලන මණ්ඩලයට බලය ඇත. එම නම් කිරීම් දේශපාලන මණ්ඩලයේ නිර්දේශය සමග අනුමැතිය සඳහා මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළ යුතුය. අනුමත කරනු ලබන අපේක්ෂකයින්ගේ ලේඛන හා තෝරාපත්කරනු ලබන සභිකයින්ගේ නම් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් මැතිවරණ කොමිෂන් සභාවට දැනුම් දිය යුතුය.

17.8 ජාතික නියෝජිත සම්මේලනය විසින් අංක 15.1 දරණ ප්‍රතිපාදන යටතේ තෝරා පත්කරනු ලබන මධ්‍යම කාරක සභාවට සාමාජිකයින් 10 දෙනෙකු නිර්දේශ කිරීමට දේශපාලන මණ්ඩලයට බලය ඇත.

17.9 පක්ෂයේ අවශ්‍යතාවයන් සපුරාලනු පිණිස පක්ෂයේ හෝ අනුබද්ධ සංවිධාන කමිටුවලට පස් දෙනෙකුට නොවැඩි සාමාජිකයන් පත්කිරීමට මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව දේශපාලන මණ්ඩලයට බලය ඇත.

**18. විධායක සභාව සහ එහි සංයුතිය**

18.1 ආසන මධ්‍යම සංවිධානවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන අය විධායක සභාව පැවැත්වීමට දින 14 කට පෙර ආසන මධ්‍යම සංවිධානයේ මෙම තනතුරුවල ඇබෑර්තුවක් පැවතියහොත් විධායක සභාවට සහභාගී වන නියෝජිතයා වශයෙන් මෙම ආසන මධ්‍ය සංවිධානයේ නිලධාරීන් 13 දෙනා අතුරින් අයෙකු ආසන මධ්‍ය සංවිධානයේ අනුමැතිය ඇතිව විධායක සභාවට සහභාගී විය හැක.

18.2 දිස්ත්‍රික් සංවිධාන කමිටු ලේකම්වරු හා කළමණාකාරවරු

18.3 (i) මහජන තරුණ පෙරමුණෙන් තෝරා එවනු ලබන නියෝජිතයින් 10 දෙනෙකු
(ii) ශ්‍රී ලංකා මහජන කාන්තා සම්මේලනයෙන් තෝරා එවනු ලබන නියෝජිතයින් 10 දෙනෙකු
(iii) පක්ෂ ව්‍යවස්ථාවේ 2 (ආ) හි සඳහන් අනෙකුත් අනුබද්ධ සංවිධානවලින් නම්කරනු ලබන නියෝජිතයින් 05 දෙනෙකු

18.4 පක්ෂයේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ පළාත් සභා මන්ත්‍රීවරු

18.5 පළාත් පාලන ආයතන සභිකවරු

18.6 දේශපාලන මණ්ඩලය විසින් පත් කරනු ලබන සාමාජිකයින් 25 දෙනෙකු

18.7 සියලුම මධ්‍යම කාරක සභිකයින්

18.8 පක්ෂ ව්‍යවස්ථාවේ 11.4 යටතේ පත්කරනු ලබන තාවකාලික සංවිධායකවරුන්, කළමණාකරුවන් හා 15.9 යටතේ පත්කරනු ලබන අනුශාසක මණ්ඩලය හා 15.10 යටතේ පත්කරනු ලබන උපදේශක මණ්ඩලයේ සාමාජිකයින්

## 19. විධායක සභාවේ බලතල හා වගකීම්

19.1 පක්ෂයේ ජාතික නියෝජිත සම්මේලනයෙන් ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා පක්ෂයේ මධ්‍යම කාරක සභාව සහ දේශපාලන මණ්ඩලය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග විමර්ශනයට ලක්කිරීම, ඒ ගැන ඵලදායී විවේචනයක් ඇති කිරීම, පක්ෂ සම්මේලන තීරණ ක්‍රියාත්මක කිරීමට මග පෙන්වීම සහ දායකවීම.

19.2 රටතුළ පවතින දේශපාලන තත්ත්වය අනුව පක්ෂයේ ක්‍රියාමාර්ග, පක්ෂ ප්‍රතිපත්තිවල පදනම අනුව මෙහෙයවීම සඳහා මධ්‍යම කාරක සභාවට උපදෙස් ලබාදීම.

19.3 පක්ෂයේ සංවිධානාත්මක සමගිය පවත්වාගෙන යාම සඳහා ද, පක්ෂය ජනතාව තුළ ප්‍රචලිත කිරීම සඳහා පක්ෂ කටයුතු පුළුල් ලෙස ජනතාව තුළට ගෙනයාම පිළිබඳව යෝජනා සහ අදහස් ඉදිරිපත් කිරීම. එසේ ඉදිරිපත් කරනු ලබන යෝජනා විධායක සභා රැස්වීමට දෙසතියකට පෙර පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

19.4 පක්ෂයේ නියෝජිත සම්මේලනය පැවැත්වීමට නියමිත දිනට දෙමසකට පෙර විධායක සභා රැස්වීම පැවැත්වීම සහ ජාතික සම්මේලනය සාර්ථක කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග සහ යෝජනා ඉදිරිපත් කිරීම.

19.5 විධායක සභාව යටත් පිරිසෙයින් තෙමසකට වරක් රැස්විය යුතුය.

19.6 රටේ දේශපාලනයේ හෝ රටේ හදිසි තත්ත්වයක් පවතින අවස්ථාවකදී විධායක සභාවේ සාමාජිකයන්ගෙන් තුනෙන් එකක සාමාජිකත්වයක් විසින් ලිඛිත ඉල්ලීමක් කළවිට එසේ විධායක සභා රැස්වීමක් කැඳවීමට පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා බැඳී සිටී.

## 20. ජාතික නියෝජිත සම්මේලනය

20.1 ජාතික නියෝජිත සම්මේලනය පක්ෂයේ ඉහළම බල අධිකාරිය හා සංවිධානය වේ. ජාතික නියෝජිත සම්මේලනයේ තීරණය අවසාන තීරණය වේ.

20.2 ජාතික නියෝජිත සම්මේලනය තුන්වසරකට වරක් කැඳවිය යුතුය. එකී කාලය තුළ සම්මේලනය කැඳවීම වළක්වන හේතු හෝ තත්ත්වයන්ගෙන් බාධක හෝ ඇතොත් එක් වසරකට නොවැඩි කාලයකට ජාතික සම්මේලනය කැඳවීම ප්‍රමාද කිරීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත්තේය.

20.3 පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ජාතික නියෝජිත සම්මේලනය කැඳවිය යුතුය. පක්ෂයේ මුළු සාමාජිකත්වයෙන් අඩකට නොඅඩු පිරිසක් විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් අනුව ජාතික සම්මේලනය කැඳවීමට මධ්‍යම කාරක සභාව බැඳී සිටී. එසේ කරනු ලබන ඉල්ලීමට හේතු ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

20.4 ජාතික නියෝජිත සම්මේලනය කැඳවනු ලබන දිනය, ස්ථානය, එහි න්‍යාය පත්‍රය, ජාතික සම්මේලනයට නියෝජිතයන් තෝරා පත්කර ගත යුතු පදනම සහ ආකාරය ද මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුතුය. කෙසේ වුවද මධ්‍යම කාරක සභාව විසින් සකස් කරනු ලබන ජාතික නියෝජිත සම්මේලනයේ න්‍යාය පත්‍රය එකී ජාතික නියෝජිත සම්මේලනයේ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක විය යුතුය.

20.5 ජාතික නියෝජිත සම්මේලනයට නියෝජිතයන් තෝරා පත්කර ගත යුත්තේ සමස්ත පක්ෂ සාමාජිකත්වය සහ සංවිධාන නියෝජනය වන ආකාරයෙනි.

20.6 ජාතික සම්මේලනයට සහභාගී වන නියෝජිතයන්ගෙන් මධ්‍යම කාරක සභිකයන් වශයෙන් තේරී පත්වීමට සුදුසුකම් ඇත්තේ ජාතික සම්මේලනය පැවැත්වෙන දිනට තෙමසකට පෙර පක්ෂ සාමාජිකත්වය ලබාගෙන ඇති සාමාජිකයන්ට පමණි.

20.7 ජාතික සම්මේලනය කැඳවීමට යටත් පිරිසෙයින් සති හතරකට පෙර න්‍යාය පත්‍රය හා කැඳවීම් ලිපි පක්ෂ සංවිධානවලට ප්‍රධාන ලේකම්වරයාගේ අත්සනින් යැවිය යුතුය.

20.8 කෙටුම්පත් වාර්තා, න්‍යාය පත්‍රය, යෝජනා හා ව්‍යවස්ථා සංශෝධන, ජාතික සම්මේලනය පැවැත්වෙන දිනට දෙසතියකට පෙර මධ්‍යම කාරක සභාව වෙත ප්‍රධාන ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ යුතුය.

**21. ජාතික නියෝජිත සම්මේලනයේ සංයුතිය**

21.1 ආසන මධ්‍ය සංවිධානවලින් එකී ආසන මධ්‍ය සංවිධානවල නිලධාරීන් 09 දෙනා ඇතුළුව එකී ආසන මධ්‍ය සංවිධානවලින් තෝරා පත්කරගන්නා නියෝජිතයින් 25 දෙනකු ද

21.2 (i) මහජන තරුණ පෙරමුණෙන් තෝරාගත් නියෝජිතයින් 25 දෙනෙකුට නොවැඩි සාමාජිකයින් ද
(ii) ශ්‍රී ලංකා මහජන කාන්තා සම්මේලනයෙන් තෝරාගත් නියෝජිතයින් 25 දෙනෙකුට නොවැඩි සාමාජිකාවන් ද
(iii) අනෙකුත් අනුබද්ධ සංවිධානවලින් එක් සංවිධානයකින් තෝරාගත් 15 දෙනෙකුට නොවැඩි සාමාජිකයන් ද
(iv) සම්මේලනයට පෙර පැවති දේශපාලන මණ්ඩලය විසින් නම් කරනු ලබන නිරීක්ෂණ නියෝජිතයින් 25 දෙනෙකුට නොවැඩි (ඡන්දය බලය නොමැති) පිරිසක් ජාතික නියෝජිත සම්මේලනයේ නියෝජිතයින් වශයෙන් සහභාගී වනු ඇත.

21.3 ආසන මධ්‍ය සංවිධාන පිහිටුවා නොමැති ආසන බල ප්‍රදේශවල පිහිටුවා ඇති ක්‍රියාකාරී කමිටු විසින් එක් ආසන බල ප්‍රදේශයකින් නියෝජනය විය යුතු නියෝජිත ගණන මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ඇත.

21.4 මධ්‍යම කාරක සභාවේ ආසන බල ප්‍රදේශ හෝ අනුබද්ධ සංවිධාන නියෝජනය නොකරන සියළුම මධ්‍යම කාරක සභිකයන් ද ජාතික නියෝජිත සම්මේලනය නියෝජනය කරනු ඇත.

21.5 ඉහත සඳහන් ප්‍රතිපාදන යටතේ නියෝජනය නොවන එහෙත් ජාතික සම්මේලනය තුළ නියෝජනය වියයුතු ජන කොටස් නියෝජනය කිරීම සඳහා 10 දෙනෙකු නොවැඩි නියෝජිත සංඛ්‍යාවක් පත්කිරීමට ජාතික නියෝජිත සම්මේලනයට පෙර පැවැත්වෙන අවසාන මධ්‍යම කාරක සභාවට බලය ඇත.

**22. ජාතික නියෝජිත සම්මේලනයේ බලතල සහ අයිතිවාසිකම්**

22.1 ජාතික නියෝජිත සම්මේලනයේ න්‍යාය පත්‍රය හා ස්ථාවර නියෝග සම්මත කිරීම.

22.2 පක්ෂයේ ඉදිරි වැඩ පිළිවෙල, ප්‍රතිපත්ති හා දේශපාලන ක්‍රියාමාර්ග හා පක්ෂයේ ව්‍යවස්ථාව සම්මත කිරීම හා අවශ්‍ය පරිදි සංශෝධනය කිරීම.

22.3 ජාතික නියෝජිත සම්මේලනය විසින් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට නියෝජිතයින් 63 දෙනෙකු තෝරා පත්කරගැනීම.

**23. විශේෂ ජාතික නියෝජිත සම්මේලනය**

23.1 ජාතික නියෝජිත සම්මේලන දෙකක් අතරතුර කාලපරිච්ඡේදය තුළදී විශේෂ ජාතික නියෝජිත සම්මේලනයක් කැඳවීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත. විශේෂ ජාතික නියෝජිත සම්මේලනයේ තීරණ ක්‍රියාත්මක කිරීමට සියළුම පාක්ෂිකයින් බැඳී සිටී.

23.2 විශේෂ ජාතික නියෝජිත සම්මේලනයක් කැඳවීමේදී ජාතික නියෝජිත සම්මේලනයක් කැඳවන ප්‍රතිපාදන අනුගමනය කළ යුතු වුවත් අවශ්‍ය පරිදි වෙනස්කම් කිරීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත.

23.3 සාකච්ඡා, සම්මේලන කැඳවීමට මධ්‍යම කාරක සභාවට බලයට ඇත. එකී කැඳවීමේ පදනම තීරණය කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතුය.

**24. විනය කමිටුව**

24.1 විනය කමිටුව පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් පත්කළ යුතුය. මෙම කමිටුව මධ්‍යම කාරක සභිකයින් හෝ නොවන ජ්‍යෙෂ්ඨයින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

## 25. විනය පාලනය

25.1 විනය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී එහි අරමුණ විය යුත්තේ පක්ෂයේ හා සංවිධානවල සමගිය ඇති කිරීමෙන් පක්ෂයේ ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්වය හා ස්ථාවරත්වය සහතික කිරීමත් සහ දේශපාලන හැඩගැස්ම සංවර්ධනය කිරීමත්ය.

25.2 පක්ෂයේ ඕනෑම සංවිධානයකට හෝ සාමාජිකයකුට විරුද්ධව විනයානුකූලව ක්‍රියාකිරීමේ අයිතිය මධ්‍යම කාරක සභාවට තිබේ.

25.3 විනය විරෝධීව කටයුතු කරනු ලැබ ඇති සාමාජිකයෙකුට හෝ සංවිධානයකට විරුද්ධව පරීක්ෂණ කටයුතු පවත්වන බව හා එසේ පවත්වනු ලබන දිනය වේලාව සහ ස්ථානය මෙම සාමාජිකයාට හා සංවිධානයට එල්ලවී ඇති චෝදනාද පරීක්ෂණයට යටත් පිරිසෙයින් සති දෙකකට පෙර අදාල සාමාජිකයාට/හෝ සංවිධානයට දැන්විය යුතුය. කෙසේ වුවද සාමාජිකයා /හෝ සංවිධානය පරීක්ෂණයට නොපැමිණ ඇතොත් පිළිගත හැකි හේතු නොමැතිව හෝ එසේ නොපැමිණෙන බව සාධාරණ හේතු ඇතිව දන්වා නොමැතිව හෝ එසේ නොපැමිණෙන බව සාධාරණ හේතු ඇතිව දන්වා නොමැති නම් හෝ එකී සාමාජිකයාගේ හෝ සංවිධානයට විරුද්ධව ඒක පාර්ශවිකව පරීක්ෂණයක් මධ්‍යම කාරක සභාව විසින් පත්කරනු ලබන විනය කමිටුවට කරගෙන යා හැකිය.

25.4 පක්ෂයේ සංවිධානයක සමගිය හෝ දේශපාලන ප්‍රතිරූපය කෙරෙහි බරපතල විනය විරෝධී ක්‍රියා පිළිබඳ චෝදනා මත අදාල පක්ෂ සාමාජිකයාගේ හෝ පක්ෂ සංවිධානයේ ක්‍රියාකාරීත්වය/ සාමාජිකත්වය අත්හිටුවීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත. කෙසේ වුවද එසේ සාමාජිකත්වය හෝ ක්‍රියාකාරිත්වය අත්හිටුවීමෙන් මසක් ඇතුලත විනය පරීක්ෂණය ආරම්භ කළ යුතුය තුන්මසක් තුලදී විනය පරීක්ෂණ පවත්වා අවසන් කළ යුතුය.

25.5 තමන්ට විරුද්ධව ගන්නා ලද විනය තීන්දුවට විරුද්ධව මධ්‍යම කාරක සභාවට අභියාචනා කිරීමේ අයිතිය සෑම සාමාජිකයකුටම හෝ සංවිධානයකටම තිබේ.

25.6 මධ්‍යම කාරක සභාව විසින් දෙනු ලබන තීන්දුව අවසාන තීන්දුව වේ.

## 26. පක්ෂ සාමාජිකත්වය අහෝසි කිරීම

26.1 පිළිගත හැකි හේතුවක් නොමැතිව තමන් අයත් පක්ෂ සංවිධානයේ එක දිගට රැස්වීම් තුනකට සහභාගී වීමට අසමත් වන ඕනෑම සාමාජිකයකුගේ පක්ෂ සාමාජිකත්වය අහෝසිවී ඇති සේ සැලකිය යුතුය. එහෙත් එසේ පක්ෂ සාමාජිකත්වය අහෝසිවී ඇතැයි සැලකෙන බවට තීරණයක් ගැනීමට පෙර අදාල සාමාජිකයාට සති දෙකක් තුලදී පිළිගත හැකි හේතුවක් හෝ සතුටුදායක පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන ලෙස ඔහුට හෝ ඇයට අදාල පක්ෂ සංවිධානය විසින් දැනුම්දිය යුතුය. එසේ නියමිත කාලය තුලදී පිළිගත හැකි පිළිතුරක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් සිය පක්ෂ සංවිධානය විසින් මධ්‍යම කාරක සභාවට දැනුම්දිය යුතුය. සාමාජිකත්වය පිළිබඳ අවසාන තීරණය ගනු ලැබිය යුත්තේ. මධ්‍යම කාරක සභාවටය.

26.2 පක්ෂයෙන් ඉල්ලා අස්වන ඕනෑම සාමාජිකයකු ඒ සඳහා ඉදිරිපත් කරන හේතු හෝ අදහස් අදාල සංවිධානයට ලැබීමෙන් පසු මේ ගැන සළකා බලා දෙසතියක් තුලදී පිළිතුරු දිය යුතුය. මේ පිළිබඳව මධ්‍යම කාරක සභාවට දැනුම්දිය යුතු අතර අවසාන තීරණය මධ්‍යම කාරක සභාවට ප්‍රධාන ලේකම්වරයා විසින් දැනුම්දිය යුතු අතර අවසාන තීරණය මධ්‍යම කාරක සභාව සතු වේ.

## 27. සාමාජිකයන් හා පක්ෂ සංවිධානයන්ගේ විනය පැවැත්වීම

පහත සඳහන් හේතුමත සාමාජිකයකුට හෝ පක්ෂ සංවිධානයකට හෝ විරුද්ධව විනයානුකූලව ක්‍රියාකළ යුතුය.

27.1 7 වන වගන්තියේ සඳහන් සාමාජිකයකුගේ වගකීම් හා යුතුකම් ඔහු/ඇය විසින් පැහැර හැරීම හෝ ඊට පටහැනිව ක්‍රියා කිරීම.

27.2 පක්ෂ ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාව උල්ලංඝනය වන අන්දමින් කටයුතු කිරීම.

27.3 පක්ෂ තීරණ ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ පැහැර හැරීම.

27.4 කඩාකප්පල්කාරී හා කල්ලිවාදී කටයුතුවල යෙදීමෙන් පක්ෂයේ සමගියට හා ස්ථාවරභාවයට පටහැනි වන සේ ක්‍රියා කිරීම.

27.5 පක්ෂයේ අරමුදල්/සම්පත් හා දේපල වැරදි ලෙස පරිහරණය කිරීම.

27.6 පක්ෂයට අපකීර්තිය ගෙන දෙන පුද්ගලික හෝ සමාජ හැසිරීම්

27.7 පක්ෂය ඉදිරියේ අවංක හා සත්‍යගරුක නොවීම

27.8 පක්ෂ සාමාජිකත්වයන්ට විරුද්ධව අවලාද ප්‍රචාරය කිරීම හෝ ඒ සඳහා අනුබලදීම.

27.9 පක්ෂයේ තීරණය අනුව පිළිගත හැකි හේතු නොදක්වා නියමිත මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හෝ වගකීම් මගහැරීම.

28. සාමාජිකයන්/සංවිධානයකට විරුද්ධව විනයානුකූලව ක්‍රියාකිරීම හා දඬුවම්

28.1 අවවාද කිරීම

28.2 පක්ෂ අභ්‍යන්තරයේ දෝෂ දර්ශනයට ලක්කිරීම

28.3 පක්ෂයේ දරණ ලද තනතුරුවලින් ඉවත්කිරීම හෝ පක්ෂ සංවිධානයක තනතුරකට පත්වීමේ අයිතිය අවුරුදු තුනකට නොවැඩි නිශ්චය කරන ලද කාලයකට අත්හිටුවීම

28.4 හය මාසයකට නොවැඩි නිශ්චය කරනලද කාලපරිච්ඡේදයකට සාමාජිකත්වය අත්හිටුවීම

28.5 පක්ෂ සාමාජිකත්වයෙන් නෙරපීම සහ පක්ෂ සාමාජික ලේඛනයෙන් ඔහුගේ/ඇයගේ නම ඉවත් කිරීම.

28.6 පක්ෂ සංවිධානයක් නම් එය විසුරුවා හැරීම හෝ ප්‍රතිසංවිධානය කිරීම

29. මුදල් කාරක සභාව

29.1 පක්ෂයේ සභාපති, ප්‍රධාන ලේකම් සහ භාණ්ඩාගාරික ඇතුළු මුදල් කාරක සභාවක් මධ්‍යම කාරක සභාව විසින් පත්කළ යුතුයි.

29.2 පක්ෂයට ලැබෙන සියළුම මුදල් සඳහා භාණ්ඩාගාරික විසින් හෝ භාණ්ඩාගාරික නොමැති අවස්ථාවලදී දේශපාලන මණ්ඩලය විසින් නම්කර ඇති අයෙකු විසින් කුවිතාන්සි නිකුත්කළ යුතුය. විධිමත් ලෙස පොත් පත් පවත්වගෙන යා යුතුය.

29.3 පක්ෂ සාමාජික මුදල් අයකර ගැනීම සඳහා මුදල් වර්ෂය අවසාන වීමට සතියකට පෙර සාමාජිකයන් වෙත දැන්වීමට භාණ්ඩාගාරික ක්‍රියා කළ යුතුය. අඛණ්ඩව සාමාජික මුදල් ලබාගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් භාණ්ඩාගාරික විසින් සකස් කළ යුතුය. සෑම වසරකම දෙසැම්බර් මස 31 සිට ඊළඟ වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මුදල් වර්ෂය ලෙස සැළකිය යුතුය.

29.4 පක්ෂ කටයුතු සඳහා අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය යෝජනා සහ සැලසුම් සකස් කොට මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කිරීමට මුදල් කාරක සභාවට බලය ඇත.

29.5 බැංකු ගිණුම් වල මුදල් ගණුදෙනු කිරීම, සභාපති හෝ ප්‍රධාන ලේකම් හා භාණ්ඩාගාරික යන දෙදෙනෙකුගේ අත්සනින් විය යුතුය.

29.6 මුදල් කාරක සභාවේ අනුමැතිය ඇතුළුව එදිනෙදා වියදම් සඳහා මුදල් ප්‍රමාණයක් භාණ්ඩාගාරික විසින් තබාගත යුතුය. භාණ්ඩාගාරික විසින් මාස්පතා අදාල අයවැය ලේඛණයක් පක්ෂයේ දේශපාලන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

29.7 ගණන් පරීක්ෂකවරයෙකු විසින් සකස් කරන ලද සම්පූර්ණ අයවැය වාර්තාවක් මුදල් කාරක සභාව විසින් මධ්‍යම කාරක සභාව මගින් ජාතික නියෝජිත සම්මේලනයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

30. පක්ෂයේ චංචල හා නිශ්චල දේපල

30.1 පක්ෂයේ සභාපති, ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික හා මධ්‍යම කාරක සභාව විසින් පත්කරනු ලබන තවත් තුන්දෙනෙකුගෙන් පක්ෂයේ දේපල භාරකාර මණ්ඩලය සමන්විත වන්නේය.

30.2 පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ තීරණය අනුව පක්ෂය සතු හා පක්ෂයට සතුවන කවරාකාර හෝ නිශ්චල/ චංචල දේපල විකිණීම, උකස් තැබීම/ ගැනීම, කුලියටදීම/ ගැනීම, බදු දීම/ ගැනීම, මිළදී ගැනීම භාරකාර මණ්ඩලයේ සාමාජිකයින් අතරින් පක්ෂයේ සභාපතිගේ හා ප්‍රධාන ලේකම්ගේ අත්සනින් කළ යුතුය.

31. ප්‍රධාන ලේකම්වරයා සතු බලතල

31.1 ප්‍රධාන ලේකම්වරයා පක්ෂයේ නායකත්වය දරනු ලබයි. ඔහු/ඇය විසින් මධ්‍යම කාරක සභාව ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, මගපෙන්වීම හා සමාලෝචනය කිරීමේ වගකීම පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා සතු වේ.

31.2 සාමාජිකයින්ට හා සංවිධානවලට මධ්‍යම කාරක සභාව විසින් ගනු ලබන තීරණ දැනුම්දීම සිදුකරනු ලබන්නේ ප්‍රධාන ලේකම්වරයා විසින්ය.

31.3 ප්‍රධාන ලේකම්වරයා සෑම විටකම පක්ෂ නායකත්වය ද දරනු ලබන හෙයින් පක්ෂයට නිසිමග පෙන්වීම, පක්ෂයේ උන්නතිය වෙනුවෙන් කටයුතු කිරීම, අනෙකුත් පක්ෂ හා සංවිධාන මෙන්ම පුද්ගලයින් සමග සාකච්ඡා කිරීම, ජාත්‍යන්තර සබඳතා වර්ධනය කරගැනීම, පක්ෂය ජනතාව අතර ප්‍රචලිත කිරීම ආදිය ඔහු/ඇය විසින් සිදුකරනු ලැබිය යුතුය.

32. සභාපතිවරයා සතු බලතල

32.1 සභාපතිවරයා සෑම රැස්වීමකම මූලාසනය දරනු ලබයි. ඔහු/ඇය විසින් මධ්‍යම කාරක සභාව ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, මගපෙන්වීම හා සමාලෝචනය කිරීමේ දී පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට සහාය ලබාදිය යුත්තේය.

32.2 සාමාජිකයින්ට හා සංවිධානවලට මගපෙන්වීම, පක්ෂයේ උන්නතිය වෙනුවෙන් කටයුතු කිරීම, අනෙකුත් පක්ෂ හා සංවිධාන මෙන්ම පුද්ගලයින් සමග සාකච්ඡා කිරීම, ජාත්‍යන්තර සබඳතා වර්ධනය කරගැනීම, පක්ෂය ජනතාව අතර ප්‍රචලිත කිරීම ආදිය ඔහු/ඇය විසින් සිදුකරනු ලැබිය යුතුය.

33. ව්‍යවස්ථා සංශෝධනය කිරීම හා ඒ පිළිබඳව අර්ථ නිරූපනය කිරීම.

33.1 ව්‍යවස්ථා සංශෝධනය කිරීමේ හෝ නව ව්‍යවස්ථාවක් සම්මත කිරීමේ අයිතිය ජාතික නියෝජිත සම්මේලනයකට හෝ විශේෂ ජාතික නියෝජිත සම්මේලනයකට පැවරේ.

33.2 ව්‍යවස්ථා සංශෝධන හෝ නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම සඳහා ජාතික නියෝජිත සම්මේලනයට සහභාගිවන නියෝජිත පිරිසකගෙන් 50 කට වැඩි සංඛ්‍යාවක් කැමැත්ත ලබා දිය යුතුය.

34. පක්ෂයේ යම් කටයුත්තක් සඳහා මෙම ව්‍යවස්ථාවෙන් අවශ්‍ය ප්‍රතිපාදනයන් සඳහන් නොවන්නේ නම් ඒ පිළිබඳ විධානයක් කිරීමට, මෙම ව්‍යවස්ථාවේ යම් ප්‍රතිපාදනයක ව්‍යාකූලත්වයක් ඇත්නම් හෝ යම් යම් ප්‍රතිපාදනවල පරස්පර විරෝධී තත්ත්වයක් ඇත්නම් හෝ යම් ප්‍රතිපාදනයක අර්ථ නිරූපනය දෙයාකාරයක් වන්නේ නම් හෝ මධ්‍යම කාරක සභාව ඒවා ගැන දෙන තීරණය අවසාන තීරණය වන්නේය.

35. ගණ පූර්ණය
පක්ෂයේ ජාතික නියෝජිත සම්මේලනය සහ විශේෂ ජාතික නියෝජිත සම්මේලන රැස්වීම හැර, පක්ෂයේ අනිකුත් සියළුම සංවිධාන වල ගණ පූර්ණය අදාල සංවිධානයේ සාමාජිකත්වයෙන් 1/3ක් විය යුතුය.